හිතවත් ගනුදෙනුකාර මහතාණෙනි/මහත්මියනි,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ සදහන් කර ඇති අවශ්‍යතාවයකට අනුව, අප විසින් පිරිනමනු ලබන්නාවූ, ඔබට අවශ්‍යවන සහ ඔබට සුදුසු බැංකු සැලසුම්/සේවාවන් තෝරා ගැනීමේදී ඔබට සහය වීම අරමුණු කොටගෙන ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මාලාවක් අප විසින් සකස් කර ඇත.

මෙම ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මඟින් ඔබට විවිධාකාරයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් සහ ගිණුම් ආශ්‍රිත විශේෂ පැකේජ පිළිබදව සහ පුද්ගලික බැංකුකරණය සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි පුද්ගලික විදේශ මුදල් ගිණුම් පිළිබඳව පුළුල් අවබෝධයක් ඔබට ලබා දෙනු ඇත.

කෙසේ වෙතත්, පහත සදහන් ප්‍රධාන කරුණු අඩංගු ලේඛන (KFD) හි දක්වා ඇති කරුණු, නීතියෙහි සහ නියාමනයෙහි සිදුවන වෙනස්කම් සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් අනුව සංශෝධනයට ලක්විය හැකි බව කරුණාවෙන් සලකන්න. බැංකුවේ එවැනි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් සම්බන්ධයෙන් ප්‍රධාන කරුණු අඩංගු ලේඛන (KFD) හි කෙරෙන ඕනෑම සංශෝධනයක් පිළිබදව බැංකුව විසින් ඔබ දැනුවත් කරනු ලබන බව සලකන්න.

ඔබට වැඩිදුර තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් කරුණාකර පහත සදහන් ආකාරයට www.nationstrust.com ඔස්සේ හෝ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානයේ දුරකථන අංක 011 4 711 411 හරහා අප හා සම්බන්ධ වන්න.

පහත සපයා ඇති ඔබගේ කිසියම් ගිණුමක් සම්බන්ධයෙන් ඔබට කුමන හෝ පැමිණිල්ලක් ඇත්නම් කරුණාකර පැමිණිලි නිරාකරණය කිරීමේ නිලධාරි, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242, යුනියන් පෙදෙස, කොළඹ 2 යන ලිපිනයට පැමිණිල්ලේ දැන්වීම ඇතුළත් කෙටි ලිඛිත ප්‍රකාශයක් අප වෙත යොමු කරන්න. නැතහොත් දුරකථන: [+94(0)114711411] / [customerservice@nationstrust.com] යන විද්‍යුත් තැපෑලෙන් අප හා සම්බන්ධ වන්න. අපි ඉක්මනින් ඔබට ප්‍රතිචාර දක්වන්නෙමු.

ගිණුම පිළිබඳ විස්තර	ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ	ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු	ගිණුමක් විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය	ප්‍රධාන නියමයන් සහ කොන්දේසි
කාලීන තැන්පතු				
නේෂන්ස් ස්ථාවර තැන්පතු	පොලී අනුපාත මාස 01 සිට මාස 60 දක්වා කාල සීමාව මත පදනම් වේ. ගනුදෙනුකරුවාගේ තේරීම අනුව කල්පිරීමේදී හෝ මාසිකව හෝ වාර්ෂිකව පොලී ගෙවනු ලැබේ. දින 30 සිට දින 365 දක්වා කාලය තුළ අවශ්‍ය දින ගණන් අනුව ස්ථාවර තැන්පතුවක් විවෘත කිරීමේ විකල්පය තෝරාගත හැකිය. ස්ථාවර තැන්පතු වටිනාකමින් 90% දක්වා අයිරා පහසුකම සහ ණය පහසුකම් ලබාගැනීමේ හැකියාව.	ස්ථාවර තැන්පතුවක් පවත්වාගෙන යාම සඳහා බැංකු ගාස්තු අය නොකෙරේ.	බැංකුවේ සම්මත කාලීන ගිණුම් විවෘත කිරීමේ පෝරම සම්පූර්ණ කළ යුතු අතර පහත සඳහන් ලේඛන සමග ඕනෑම බැංකු ශාඛාවකට ඉදිරිපත් කළ යුතුය: • ජාතික හැඳුනුම්පතෙහි (NIC) / වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක් • ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් පදිංචි ලිපිනය වෙනස් නම් ලිපිනය තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි අවශ්‍ය වේ.	සුදුසුකම් ලැබීමේ නිර්ණායක: • වලංගු ජාතික හැඳුනුම්පතක් / විදේශ ගමන් බලපත්‍රයක් ඇති වයස අවුරුදු 18ට වැඩි ශ්‍රී ලංකාවේ වෙසෙන ශ්‍රී ලාංකික පුරවැසියන් • අවම මූලික තැන්පතුව රුපියල් 50,000 කි. • ස්ථානගත කිරීමෙන් දින 30කට පෙර අවසන් කළහොත් (ස්ථානගත කළ දිනය ඇතුලත්ව සහ ඈවර කළ දිනය හැර) පොලී ගෙවනු නොලැබේ. • කල්පිරීමට පෙර ස්ථාවර තැන්පතුව ඉවත් කරගනු ලැබුවහොත්, ගෙවිය යුතු පොළිය එකඟ වී ඇති අනුපාතිකයට වඩා අඩු අනුපාතයක් මත සහ බැංකුවේ අභිමතය පරිදි ගණනය කෙරේ. • කල්පිරීමට පෙර ස්ථාවර තැන්පතුවක් ඉවත්කර ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබුවහොත් සහ එකී ඉල්ලීම ඉදිරිපත් කරන මොහොත වනවිට මාසිකව ගනුදෙනුකරුවාට පොලී ගෙවා ඇත්නම්, කල්පිරීමට කලින් මුදල් ආපසු ගැනීමේ ගාස්තුව මුල් තැන්පතු මුදලින් අඩු කරනු ලැබේ.

ගිණුම පිළිබඳ විස්තර	**ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ**	**ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු**	**ගිණුමක් විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය**	**ප්‍රධාන නියමයන් සහ කොන්දේසි**
ඇමතුම් (Call) තැන්පතු	පොලිය අවම වශයෙන් දින 7ක් සඳහා ගණනය කර කල්පිරීමේදී එය ගෙවනු ලැබේ.	ඇමතුම් (Call) තැන්පතු පවත්වාගෙන යාම සඳහා බැංකු ගාස්තු අය නොකෙරේ.	බැංකුවේ සම්මත කාලීන ගිණුම් විවෘත කිරීමේ පෝරම සම්පූර්ණ කළ යුතු අතර පහත සඳහන් ලේඛන සමග ඕනෑම බැංකු ශාඛාවකට ඉදිරිපත් කළ යුතුය: • ජාතික හැඳුනුම්පතෙහි (NIC) / වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක් • ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් පදිංචි ලිපිනය වෙනස් නම් ලිපිනය තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි අවශ්‍ය වේ.	සුදුසුකම් ලැබීමේ නිර්ණායක: • වලංගු ජාතික හැඳුනුම්පතක් / විදේශ ගමන් බලපත්‍රයක් ඇති වයස අවුරුදු 18ට වැඩි ශ්‍රී ලංකාවේ වෙසෙන ශ්‍රී ලාංකික පුරවැසියන් • අවම මූලික තැන්පතුව රුපියල් 100,000 කි. • අවම තැන්පතු කාලසීමාව දින 7 කි. • අවම කාලසීමාව වන දින 7 ට පෙර තැන්පතුව ආපසු ලබා ගන්නේ නම්, පොලී ගෙවනු නොලැබේ.
තැන්පතු සහතිකය	පොලිය කලින් ගෙවනු ලැබේ. උදා: එක් අවරුද්දකට පසුව 12%ක වාර්ෂික පොලී අනුපාතයකට තැන්පතු සහතිකය මත මිලියන දෙකක කල්පිරීමේ අගයක් ලබාගැනීමට නම් ගනුදෙනුකරුවා විසින් තැන්පත් කළ යුත්තේ රු. මිලියන 1.8 ක් පමණි.	තැන්පතු සහතිකයක් ලබා ගැනීම වෙනුවෙන් බැංකු ගාස්තු අය නොකෙරේ.	බැංකුවේ සම්මත කාලීන ගිණුම් විවෘත කිරීමේ පෝරම සම්පූර්ණ කළ යුතු අතර පහත සඳහන් ලේඛන සමග ඕනෑම බැංකු ශාඛාවකට ඉදිරිපත් කළ යුතුය: • ජාතික හැඳුනුම්පතෙහි (NIC) / වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක් ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් පදිංචි ලිපිනය වෙනස් නම් ලිපිනය තහවුරු කිරීම	සුදුසුකම් ලැබීමේ නිර්ණායක: • වලංගු ජාතික හැඳුනුම්පතක් / විදේශ ගමන් බලපත්‍රයක් ඇති වයස අවුරුදු 18ට වැඩි ශ්‍රී ලංකාවේ වෙසෙන ශ්‍රී ලාංකික පුරවැසියන් **අනෙකුත් කොන්දේසි:** • අවම තැන්පතුව රුපියල් 100,000 කි. · කල්පිරීමේ දිනෙන් පසුව මෙම සහනිකය සඳහා පොලී එකතු කරනු

	රුපියල් මිලියන 1.8 සහ රුපියල් මිලියන 2 අතර වූ වෙනස වන්නේ කල්පිරීමේදී ගෙවිය යුතු පොලියයි.		සඳහා ලිඛිත සාක්ෂි අවශ්‍ය වේ. නාමිකයකු පත්කිරීමේ පෝරමය	නොලැබේ. · තැන්පතු සඳහා අවම කාලසීමාව මාස හයක් [06] වන අතර උපරිම කාලසීමාව මාස හැට (60) කි. · තැන්පතුව සිදු කරන අවස්ථාවේදී WHT ලබා ගත යුතුය. · තැන්පතු සහතිකය යනු එය දරන්නාගේ ගිණුමක් නොවන හෝ අනුමත කිරීමකින් මාරු කිරීමට හෝ නොහැකි එකකි. · තැන්පතු සහතිකය කල්පිරීමෙන් පසු ස්වයංක්‍රීයව අලුත් කළ නොහැකි බැවින් පහත සඳහන් විකල්ප තෝරාගත හැකිය; තැන්පතුව ස්ථාවර තැන්පතුවක් බවට මාරු කිරීම. වෙනත් ඕනෑම බැංකු ගිණුමකට අරමුදල් මාරු කිරීම. වැටුප් ඇණවුමක් හරහා ආදායම ලබා ගැනීම. ආදායම රු. 10,000 ක ගුණාකාරවලින් අලුත් කර ඉතිරිය ගනුදෙනුකරුවාගේ ගිණුමට/වෙනත් බැංකු ගිණුමට බැර කිරීම/ චෙක්පත ගනුදෙනුකරුවාගේ ලිපිනයට තැපැල් කිරීම

- මෙහි අඩංගු නිශ්චිත නියමයන් සහ කොන්දේසි වලට අමතරව, ***කාලීන තැන්පතු සඳහා අදාළ වන සියලුම සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි සහ පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසි*** යටතේ **https://www.nationstrust.com/images/pdf/general-business-conditions.pdf** හි දක්වා ඇත.

- කලින් කලට සංශෝධනයට ලක් විය හැකි ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

- මෙම බැංකුව, රු. 1,100,000/- ක් දක්වා තැන්පත් කරන එක් තැන්පත්කරුවකුට රැකවරණය සපයනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ (SLDIS) සාමාජිකයෙකු වේ.

- මෙම ලේඛනයේ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, මෙහි ඉංග්‍රීසි භාෂා පාඨය බලපැවැත්විය යුතුය.